# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අතිවිශේෂ**

## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

2005 අංක 06 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ පනවනු ලබන නියමය

2005 අංක 06 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියමය මගින්,

1. (අ) මුළු යෙදවුම් වටිනාකමින් සියයට හැටක් (60%) දේශීය සැපයුම්/මූලාශ්‍ර වලින් ප්‍රභවය වන්නේ නම්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති හෝටල්, ආගන්තුක නිවාස, ආපනශාලා හෝ සමාන සේවා සපයන අනෙකුත් ඒ හා සමාන ආයතන විසින් සපයන සේවා මත ශුන්‍ය අනුප්‍රමාණයට (0%),

   (ආ) මූල්‍ය සේවා සැපයීම මත සියයට පහළොවක (15%) අනුප්‍රමාණයට

   (ඇ) 2018 නොවැම්බර් 1 දිනැති අංක 2095/20 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයෙහි උපලේඛනයේ I වන හා II වන තීරු වල සංයෝජිත වර්ගීකරණ සංකේත හා විස්තරයෙහි සඳහන් කරනු ලැබ ඇති භාණ්ඩ ආනයනය මත එම උපලේඛනයේ III තීරුවේ ඊට අනුරූපීව නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණයට, සහ

   (ඈ) මෙම ඡේදයේ (අ), (ආ) සහ (ඇ) උපඡේද යටතේ දක්වා ඇති සේවා සැපයීම/භාණ්ඩ ආනයනය හැර අනෙකුත් භාණ්ඩ ආනයනය සහ/හෝ සැපයීම හෝ සේවා සැපයීම මත සියයට අට (8%) අනුප්‍රමාණයට

   එකතු කළ අගය මත බද්ද අය කළ යුතු බව ප්‍රකාශයට පත් කරමි.

2. 2005 අංක 06 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ පනවන ලද 2018 නොවැම්බර් 01 දිනැති අංක 2095/19, 2019 ජුනි 01 දිනැති අංක 2125/69 හා 2019 ඔක්තෝබර් 31 දිනැති අංක 2147/59 දරන අතිවිශේෂ ගැසට් පත්‍ර මගින් ප්‍රකාශිත නියමයන් මෙයින් අවලංගු කරමි.

3. මෙම නියමය 2019 දෙසැම්බර් 01 දින සිට බලපැවැත්වෙන බව ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,  
මුදල්, ආර්ථික හා  
ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය

2019 නොවැම්බර් මස ..30.... වැනි දින  
කොළඹ 01  
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දීය.

# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka
**EXTRAORDINARY**
**PART I: SECTION (I) --- GENERAL**


## Government Notifications

ORDER UNDER SECTION 2A OF VALUE ADDED TAX ACT, No. 14 OF 2002 AS AMENDED BY ACT, No. 06 OF 2005

BY virtue of the powers vested in me by Section 2A of the Value Added Tax Act, No. 14 of 2002, as amended by Act, No. 06 of 2005, I, Mahinda Rajapaksa, Minister of Finance, Economy and Policy Development do by this Order declare that:-

1. The Value Added Tax shall be charged;

   (a) on the supply of services by a hotel, guest house, restaurant or other similar businesses providing similar services, registered with the Sri Lanka Tourism Development Authority, if sixty per centum (60%) of the total value of the inputs are sourced from local supplies/sources, at the rate of zero per centum (0%),

   (b) on the supply of financial services, at the rate of fifteen per centum (15%),

   (c) on import of goods set out in the H.S. Code and description specified in Column I and II of Schedule of the Extraordinary Gazette Notification No.2095/20 dated November 1, 2018, at the rate specified in the corresponding entry in Column III of such Schedule, and

   (d) on the import and/or supply of goods or supply of services, other than supply of services/import of goods as referred to under sub-paragraphs (a) (b) and (c) of this paragraph, at the rate of eight per centum (8%).

2. The Orders made under Section 2A of Value Added Tax Act, No. 14 of 2002, as amended by Act, No. 06 of 2005 and published in the Extraordinary Gazette Notifications No. 2095/19 dated November 01, 2018, No. 2125/69 dated June 01, 2019 and No. 2147/59 dated October 31, 2019 are hereby rescinded.

3. This Order shall come in to effect from December 01, 2019.

Sgd MAHINDA RAJAPAKSA,
Minister of Finance, Economy and Policy Development

Ministry of Finance, Economy and Policy Development
Colombo
29/11, 2019.